**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය- 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අනුරාධපුර ශාඛා කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල පිහිටි ඉඩම 2016 වර්ෂයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී තිබුණු අතර එම ඉඩම භුක්ති විඳීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.14,616,000 ක බදු මුදලක් ගෙවිය යුතු බව දැනුම් දී තිබුණි. එසේ වූවත් මෙම ගෙවිය යුතු මුදල පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් සිදුකර නොතිබුණි. | භාවිත නොකරන ලද ඉඩමක් හා ගොඩනැගිල්ල සඳහා රු.14,616,000 ක මුදලක් ගෙවා වසර 30 ක කාලයක් සඳහා පමණක් ඉඩමක් ලබා ගැනිම ආයතනය සඳහා ඵලදායි නොවන බැවින්, හා මුදල් අමාත්‍යාංශය විසින් 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි ඉදිකිරීම හා කුලියට ගැනීම නවතා තිබීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි ඒ බව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දැන්වීමට කටයුතු කර ඇත. | වගකීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නිශ්චය කළ හැකි වගකීම් ප්‍රමාණය සඳහා ප්‍රතිපාදන ඇති කළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ගෙවිය යුතු ලෙජර් ගිණුම් 16 ක ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව ශේෂයන් අතර රු.794,593 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 වසර තුළදී මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට පියවර ගත් අතර, දැනටමත් අදාළ ද්විත්ව සටහන් මගින් මෙම ගැලපීම සිදුකර ඇත. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන ශේෂයන් ගැළපීම සිදු කළ යුතු වේ. |
| (ඇ) ප්‍රධාන කාර්යාලයේ හා ශාඛා කාර්යාලයක තිබුණු වටිනාකම සඳහන් නොකළ වත්කම් අයිතම 122 ක් සමාලෝචිත වර්ෂයේ දී වත්කම් සත්‍යාපනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මෙම නිසා එම වත්කම්වල පැවැත්ම පිළිබඳ | ප්‍රධාන කාර්යාලයේ හා ශාඛාවල සත්‍යාපනය නොවූ අයිතම 122 මේ වන විට අපහරණය කර ඇත. මූල්‍ය ප්‍රකාශන වලින් ද ඉවත් කර ඇති අතර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නෙමු. | සියලුම වත්කම් සත්‍යාපනය කළ යුතු වේ. |

විගණනයේ දී තහවුරු කරගත නොහැකි විය.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ආයතනයට ලැබිය යුතු ගිණුම් ශේෂයන් තුළ වසර 06 කට වැඩි කාලයක සිට පවතින වටිනාකම රු.5,622,549 ක් වන ශේෂයන් 13ක් පවතින අතර, මෙම මුදල් මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂයන් තුළ ඇත්තේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් අය කර ගැනීමට ඇති මුදල් වේ. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලිඛිතව දැන් වූ අතර, 2022.03.30 දිනැති ලිපිය මඟින් එවැනි මුදලක් ඔවුන්ගේ ගිණුම තුළ නොමැති බව ලිඛිතව දන්වා එවා ඇත. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ එකතු වටිනාකම රු.8,688,684 ක් වූ ගෙවිය යුතු ශේෂ 22 වූ අතර, ඉන් වටිනාකම රු. 4,451,125 ක ගෙවිය යුතු කාලය වර්ෂය 06 ඉක්මවා තිබුණි. ඒවා පියවීම සම්බන්ධයෙන් ආයතනයේ අවධානය යොමුවී නොතිබුණි. | ගෙවිය යුතු ශේෂයන් සංශෝධනයෙන් වර්තමාන තත්ත්වය පහත පරිදිය. මෙහි පිළිවෙලින් රු.2,411,933 ක් හා රු.1,470,832 යන ගෙවිය යුතු ශේෂයන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ගෙවිය යුතු ශේෂයන් නොවන බව ලිඛිත තහවුරුවක් ලබාගන්නා ලදී.<br>මෙහි කාර්යසාධන සුරක්ෂණයක් සඳහා ඇප වශයෙන් තබාගන්නා ලද ශේෂයන්ගේ වගකීම් කාලය තවමත් අවසන් වී නොමැත. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නියමිත දිනට පියවීම් කිරීමට කටයුතු කළ යුතු අතර තවදුරටත් වගකීමක් නොමැති ශේෂයන් පිළිබඳ සොයා බලා පොත්වලින් ලියා හැරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1971 අංක 38 දරන මුදල් පනත 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | ආයතනය විසින් මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ සහ අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, රු.106,700,000 ක් සභාපතිවරයාගේ අනුමැතිය යටතේ පමණක් ආයෝජනය කර තිබුණි. | අප ආයතනයේ ආදායම් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා REPO ලෙස ආයෝජනය කරයි. එලෙස ආයෝජනය කරනු ලබන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිකිරීමේ බැංකුව යන ආයතනවලින් පොලී අනුපාත ගෙන්වාගෙන ඉහළම පොලී අනුපාතය පදනම් කර ගනිමිනි. | අදාළ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මු.රෙ.395 (ඇ) | එක් එක් මාසයට අදාළ බැංකු සැසැඳුම් ප්‍රකාශ ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කළ යුතු වුවත්, එක් බැංකු ගිණුමකට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනය මාස 06 ක් ප්‍රමාද කර පිළියෙල කර තිබුණි. | මේ වන විට 2022 මාර්තු මාසය දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර ඇත. | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වේ. |
| (ඇ)2003 ජුනි 02 දිනැති පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>9.12 වගන්තිය | චක්‍රලේඛය පරිදි මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.6,794,402 ක මුදලක් සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා ගෙවා තිබුණි. | මෙම සෞඛ්‍ය රක්ෂණ ආවරණය 2009 වසරේ සිට සේවකයන් වෙත ලබා දෙනු ලබන සුභසාධන පහසුකමකි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව 2021 වර්ෂය සඳහා සෞඛ්‍ය රක්ෂණ ආවරණ මුදල් රු.6,794,402 ක් ගෙවීම සිදු කර ඇත. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ)2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| 4.2.1. (අ) වගන්තිය | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු වුවද, ආයතනය විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | 4.2.1.(අ) වගන්තිය අනුමැතිය ලැබී ඇත. මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීම. 2021 වසර තුළ ශාඛා කිහිපයක් නවීකරණය කළ අතර, එක් එක් අවස්ථාවන්හි අවශ්‍යතාවය අනුව අවස්ථා කිහිපයකදී මහජන ඇමතුම් පද්ධති මිලදී ගන්නා ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. |
| 4.2.1. (ආ) වගන්තිය | අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු අතර, (ඉ) වගන්තිය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලින කළ යුතු වුවද, ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වසර තුනක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණු අතර, වසරක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි. මෙම වසර තුළ මාස 06 න් ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.123,542,486 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.290,189,169 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.166,646,683 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායමේ අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෛද්‍ය ආයතනයේ ප්‍රධාන ආදායම් තුළ ඇතුළත් සැහැල්ලු වාහන බලපත්‍ර සඳහා වෛද්‍ය සහතික පරීක්ෂණ කිරීමේ ආදායම් හා බර වාහන අලුත් කිරීමේ වෛද්‍ය ගාස්තු ආදායම් පිළිවෙලක් සියයට 48 කින් සහ සියයට 38 කින් ද අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පැදවීමෙන් වන අනතුරු වළක්වා ගැනීම සඳහා වාහන පදවන රියදුරන්ගේ මූත්‍රාවල අඩංගු නිත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය භාවිතා කර ඇත්දැයි සෙවීමේ ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය රුධිර පරීක්ෂණ කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් පමණක් සමාලෝචිත වර්ෂයේ දී ආයතනය විසින් රු.24,684,264 ක වියදම් දරා තිබුණි. නමුත් 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2022 මාර්තු 10 දින දක්වා පමණක් මෙම පරීක්ෂාව සිදු කර තිබූ අතර, පරීක්ෂණ කට්ටල නොමැති වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. | වර්තමානයේ රට තුළ මත් ද්‍රව්‍ය භාවිතා කර රිය ධාවනය කරන රියදුරන් ප්‍රමාණය වැඩි වන බව නිරීක්ෂණය වූ බැවින්, මෙම පරීක්ෂණය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලදී. | ආයතනයේ අරමුණුවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් 23 හා 2018 මැයි 15 දින ආයතනයේ තනතුරු 33 ක් සඳහා කාර්ය මණ්ඩලය 454 ක් අනුමත කර තිබුණි. එසේ වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් 375 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම යටතේ නිලධාරීන් 52 ක් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව නිලධාරීන් 27 කගේ පුරප්පාඩු පැවතුණි. | 2021.12.31 දිනට සේවක සංඛ්‍යාව 375කි. පැවති පුරප්පාඩු ප්‍රමාණය 77 වන අතර, එයින් 61 වෛද්‍ය නිලධාරීන් වේ. | පුරප්පාඩු වූ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ව්‍යවස්ථාපිත ආයතන වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2021 මූල්‍ය ප්‍රකාශන මාස 01 දින 07 ක් ප්‍රමාද කර 2022 අප්‍රේල් 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2022.04.07 දින 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ජාතික විගණන කාර්යාලය වෙත ලිඛිතව භාර දී ඇත. | චක්‍රලේඛ පරිදි නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වේ. |